මාවතගම ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන2013 මාර්තු 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 09 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මාවතගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන වියදම රු.20,173,706 ක් වූවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.18,742,519 ක් ලෙස රු.1,431,187 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ආධාර රු.12,706,426 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.17,586,806 ක් ලෙස රු.4,880,380 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ශේෂය රු.12,611,426 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.11,592,719 ක් ලෙස රු.1,018,707 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාග්ධන ණයහිමි ශේෂය රු.12,611,426 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.15,155,358 ක් ලෙස රු.2,543,932 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට අයිතිව පැවති වටිනාකම රු.11,526,650 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ඊ). ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම් ගත කල යුතු නව බස්නැවතුම්පල සැලැස්ම සකස් කිරීම හා භූමිය සකස් කිරීම සඳහා වූ රු.2,266,274 ක මුදල වැය විෂයය අංක 105 යටතේ ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු සඳහා වූ පුනරාවර්තන වැය විෂයය යටතේ ගිණුම් ගතකර තිබුණි.

(උ). සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.2,014,075 ක් වූ කසල කළමනාකරණ ව්‍යාපෘතියේ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජාතික පිළිසරු ව්‍යාපෘතියෙන් ලැබීමට හා අදාල කොන්ත්‍රාත් ආයතනයට ගෙවීමට තිබූ රු.1,061,276 ක්ද ගිණුම් ගතකර නොතිබුණි.

(ඌ). ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල ලද රු.376,595 ක වැටුප් ප්‍රතිපූර්ණ සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණ ලැබීම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(එ). සමාලෝචිත වර්ෂය අවසානයට විදුලි හා පොදු ගබඩා ශේෂය රු.459,157 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.137,360 ක් ලෙස රු.321,797 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(ඒ). සමාලෝචිත වර්ෂය තුල අයකල රු.876,400 ක් වූ එකතු කල අගය මත බදු හා රු.144,738 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු සඳහා අදාල ගැලපීම් වර්ෂය අවසානයට ගෙවිය යුතු බදු බැරකම ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ඔ). සමාලෝචිත වර්ෂය අවසානයට පුස්තකාල පොත් වටිනාකම රු.5,326,917 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.5,558,198 ක් ලෙස රු.231,281 ක් වැඩියෙන් ගෙන තිබුණි.

1.3.2 <u>අසම්භාව්‍ය බැරකම්</u>

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාලව සභාව විසින් එම අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.3,371,243 ක්ව තිබුණි .

1.3.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය යටතේ ගිණුම් විෂයයන් 7 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අනුව වූ අනුරූපී අගයන් අතර රු .3,420,132 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.39,621,260 ක් වූ අතර එයින් රු.3,457,650 ක් වසර 3 කට වඩා පැරණි ශේෂයන් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.29,688,340 ක් වූ අතර ,එයින් රු.5,153,340 ක් වසර 3 කට වඩා පැරණි ශේෂයන් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු .12,537,204 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

1.3.6 අධිකාරි බලය නොලත් ගනුදෙනු

සමාලෝචිත වර්ෂය තුල අත්තිකාරම් යටතේ පැවති රු.182,250 ක්ද, කොන්ක්‍රීට් ව්‍යාපෘතියේ ආදායම් ණයගැතියන් රු.1,372,582 ක්ද පැන නැගි ඇති ආකාරය හඳුනා ගැනීමකින් තොරව හා විධිමත් අනුමැතියකින් තොරව පිළිවෙලින් ජ'නල් සටහන් අංක 37 හා 38 මගින් සමුච්චිත අරමුදලට එරෙහිව කපාහැර තිබුණි.

02. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්ථන වියදම රු.3,336,192 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.761,466 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,097,658 ක පිරිහීමක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.18,348,731 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.23,725,326 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල ඌනතාවය රු.8,712,787 ක් දක්වා වැඩිවී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.55,161,590 න් සියයට 80 ක් ලෙස රු.44,334,604 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු හා වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.18,348,731 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.58,497,782 න් සියයට 60 ක් ලෙස රු.35,165,205 ක් පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර ඉන් සියයට 57 ක් වූ රු.20,163,541 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.23,725,326 න් සියයට 31 ක් ලෙස රු.7,467,280 ක් පමණක් සභා අරමුදලින් වැය වී තිබූ අතර, ඉතිරිය සියයට 69 ක් වූ රු.16,258,046 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සේවක භාරකාර අරමුදලට යැවිය යුතු දායක මුදල් සභාව විසින් නොයැවීම හේතුවෙන් 2013 වර්ෂය තුල එකී අරමුදලට අධිභාර ලෙස රු.21,370 ක් සභාව විසින් ගෙවා තිබුණි.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, කඩකුලි, බදුකුලී වැනි ආදායම්, ක්ෂේත්‍රයේදි එකතු කිරිම සඳහා නිශ්චිත බලයක් නොතිබුණ ද සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම වරිපනම් බදු හා වෙළඳ බලපත්‍ර වැනි ආදායම් ද ක්ෂේත්‍රයේදි එකතු කර තිබුණි.

2.4.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.3,536,503 ක් වූ අතර වාර්ෂික බිල්කිරිම රු.1,605,700 ක් විය. එහෙත් ඊට අදාලව හිඟ ලැයිස්තු පිළියෙල කර තිබුණද අවසන් නිවේදන නිකුත් කර තිබුණේ ඒකක 60 කට අදාලව රු.323,162 ක මුදලක් සඳහා පමණක් වූ අතර එකී ප්‍රමාණය සමස්ථ වරිපනම් ප්‍රදේශය ආවරණය වන පරිදි තෝරාගෙන නොතිබුණි. එයින්ද අයකරගෙන තිබුණේ සියයට 23 ක් ලෙස රු.74,347 ක් පමණක් විය. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසාන වන විට රජයේ ආයතන 4 කින් රු.277,343 ක වරිපනම් බදු අයවීමට තිබුණි.

2.4.3 කඩකුලී

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). වෙළඳපොළ කඩ කාමර 14 කට අදාලව මාසික වාරික 4 - 103 ත් අතර පරාසයකින් යුතු රු.329,708 ක හිඟයක් පැවතුණි. එමෙන්ම තාවකාලික කඩ 4 කට අදාලව රු.1,144 ක්ද, පදික කඩ 2 කට අදාලව රු.19,902 ක්ද දිගුකාලයක සිට අයවීමට පැවතුණි. මීට අමතරව වෙනත් කඩ කාමර 4 කට අදාල රු.1,055,045 ක හිඟයක්ද පැවති අතර, එයින් රු.1,008,967 ක්ම සිනමා ශාලාවක් සඳහා ගොඩනැගිල්ලක් කුලියට දීම වෙනුවෙන් විය.

(ආ). 2009 වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත ලබාගත් රු.700,000 ක මුදලින් ජංගම පදික කඩ 20 ක් සකස්කර වර්ෂ 3 ක් තුල රු.1,004 ක මාසික ණය වාරික වලින් අයකිරීමේ පදනමට හා මාසිකව රු.200 ක කුලී මුදලකට ලබාදී තිබුණි. එකී කඩ වලට අදාලව 2012 අගෝස්තු 31 දින වන විට ණය වාරික ගෙවා අවසන් වියයුතු වුවද, ණය වාරික අයවීම් පිළිබඳ ලේඛනයක් නඩත්තු කර නොතිබීම හේතුවෙන් තවදුරටත් අයවිය යුතු ණය වාරික තිබේද යන්න පරීක්ෂා කළ නොහැකි විය. පවත්වාගෙන ගොස් තිබූ කඩ කුලී ලේඛනය අනුව හා විගණනයේදී ලබාගත් තොරතුරු අනුව 2013 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 11 කට අදාල ණය වාරික හා කුලී ලෙස රු.94,290 ක හිඟයක් පැවතුණි.

2.4.4 <u>ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) හා 152(1) වගන්ති ප්‍රකාරව, කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳව ලැයිස්තුවක් පිළියෙල කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබුණද, සභාව විසින් පනවන ලද බද්ද පිළිබඳව නිවේදනය අදාල පාර්ශවයන් වෙත ලැබී දින 7 ක් ඇතුලත ගෙවන ලෙස නියම කරමින් ප්‍රා.ස. 26 B ආකෘතිය ප්‍රකාරව නිවේදනය කර නොතිබුණි. එමෙන්ම බලපත්‍ර නොගත් අය හඳුනාගෙන ඒ බව දැනුම්දීමක් හෝ උක්ත රීති ප්‍රකාරව කටයුතු කිරීමක්ද සිදුව නොතිබුණි.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව විසින් 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුල අනුමත කල ගොඩනැගිලි අයදුම්පත් 259 න් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අනුකූලතා සහතික ලබා නොගත් ස්ථාන 213 ක් විය. එම ගොඩනැගිලි සියල්ල ඉදිකර තිබුනේ නම් සභා අතුරු ව්‍යවස්ථා අනුව රු.159,750 ක අනුකූලතා සහතික ආදායමක්ද, කාලය දීර්ඝ කරවා ගැනීම් ගාස්තු ලෙස රු.370,500 ක ආදායමක්ද සභාවට උපයාගත හැකිව තිබුණි.

(ආ). මාවතගම පොදු වෙළඳපල එළහරක් මස් කඩය වෙනුවෙන් 2006 වර්ෂයට අදාලව රු.29,300 ක හිඟ බදු මුදල අයකර ගැනීම සඳහා 2008 ජූනි 10 දින පවරා තිබූ අංක 12144/19 නඩුව සඳහා අධිකරණය මගින් කැඳවා තිබූ නොතිසි භාරදීමට විත්තිකරු සොයා ගෙන නොතිබීම හේතුවෙන් 2013 දෙසැම්බර් දක්වාම නඩුව විභාගයට ගෙන නොතිබුණි.

(ඇ). පිලැස්ස ඉහලගම මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා සභාව විසින් රු.199,640 ක මුදලක් කොන්ත්‍රාත්කරුට අත්තිකාරම් ලෙස ලබාදී තිබූ අතර, කොන්ත්‍රාත්කරු විසින් රු.79,120 ක පමණ වැඩ නිම කර කොන්ත්‍රාත්තුව අත්හැර දමා තිබුණි. මෙමගින් සභාවට සිදුවූ රු.120,520 ක අලාභය අයකර ගැනීමට 2008 වර්ෂයේ සභාව විසින් නඩු පවරා තිබූ අතර, එහිදී සුදුසු ඉංජිනේරුවරයෙකුගේ මිනුම් වාර්තා ලබාගෙන ඉදිරිපත් කරන ලෙස අධිකරණය විසින් දන්වා තිබුණද මෙතෙක් සභාව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ). පැවරුම් ඔප්පුවක් යටතේ සභාව වෙත පවරා තිබූ පර්චස් 80 ක් පමණ වූ ඉඩමක සභාව විසින් මහජන පුස්තකාලය හා කොන්ක්‍රීට් වැඩපල පවත්වාගෙන ගොස් තිබුණි. එහෙත් කොන්ක්‍රීට් ව්‍යාපෘතිය අක්‍රියවීම හේතුවෙන් එම භූමිය සභාව වෙනත් කටයුත්තකට නොයොදවා වසර 15 ක් පමණ නිශ්කාර්යව පැවතීමට ඉඩහැර තිබීම හේතුවෙන් පැවරුම් ලාභියා විසින් එකී ඉඩම විකුණා තිබුණි. අදාල ගැනුම්කරු හා ප්‍රාදේශීය සභාව අතර ඉඩමේ හිමිකම සම්බන්ධ වූ පරස්පරතා හේතුවෙන් 2008 වර්ෂයේදී සභාව කොළඹ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා තිබුණු අතර, 2013 වර්ෂයේදී සභාවට වාසිවන අයුරින් තීන්දුවක් ලැබී තිබුණි. අදාල විත්තිකාර පාර්ශව එම තින්දුවට එරෙහිව අභියාචනයක් ගොනුකර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නඩුව සමතයකට පත්ව නොතිබුණි. අදාල ඉඩම නිශ්කාර්යව තිබීම හේතුවෙන් හටගත් මෙකී නඩු නිමිත්ත සඳහා 2008 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් දක්වා සභා අරමුදලින් රු389,980 ක් වැයකර තිබුණි.

(ඉ). 2010 පෙබරවාරි සිට 2013 දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව සේවක අර්ථ සාධක අරමුදලට ලියන ලද රු.1,343,619 ක් වටිනා චෙක්පත් 38 ක්ද, විශ්‍රාම වැටුප් අරමුදලට ලියන ලද රු.487,755 ක් වටිනා චෙක්පත් 14 ක්ද, ජාතික රක්ෂණ භාර අරමුදලට ලියන ලද රු.123,900 ක් වටිනා චෙක්පත් 15 ක්ද, සේවා නියුක්ති භාර අරමුදලට ලියන ලද රු.113,950 ක් වටිනා චෙක්පත් 23 ක්ද, වෙනත් ආයතන වෙත යැවිය යුතු වැටුප් අවකරණ ලෙස ලියන ලද රු.162,219 ක චෙක්පත් 58 ක්ද සභාව විසින් අදාල පාර්ශව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. ඒ හේතුවෙන් සේවක භාරකාර අරමුදලට පමණක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාද දඩ ගාස්තු ලෙස රු.21,370 ක් සභා අරමුදලින් දරා තිබූ අතර, 2010 සිට අදාල ආයතන වෙත නොයවා ඇති රු.2,231,443 ක් වෙනුවෙන් දඩ ගාස්තුද ගෙවීමට සිදුවීමේ අවදානමක් පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය. එමෙන්ම රක්ෂණ වාරික අදාල අරමුදලට නොලැබීම හේතුවෙන් දැනට රක්ෂණ ප්‍රතිලාභ අයදුම්කරන නිලධාරින්ට එකී ප්‍රතිලාභද අත්හිටුවා තිබුණි.

3.2 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

සභාවේ "පිළිසරු ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය" සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් රු.6,070,158 ක් ලබාදීමට එකහව මාස 03 ක කාලයකින් වැඩ නිම කිරීමට 2011 ජනවාරි 04 දින ගිවිසුම් ගතව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කසල ගොඩ ගසන හා තෝරන ස්ථානය තෝරාගෙන නොතිබුණු අතර, ජලය හා විදුලිය සපයා ගැනීම, ආරක්ෂක වැට හා ගේට්ටුව ඉදිකිරීම යන කාර්යයන්ද ඉටුකර නොතිබුණි. එමෙන්ම මධ්‍යම පරිසර අධිකාරියෙන් 2012 සැප්තැම්බර් 05 දින පොහොර සෑදීමේදී භාවිතා කරනු ලබන උපාංග සහිත වූ කොම්පෝස්ට් හලන යන්ත්‍රය සභාවට ලබාදී තිබුණද, වර්ෂය අවසානය තෙක් එය සවිකිරීමට කටයුතු කර නොතිබුණි. තවද, මෙම ස්ථානය ප්‍රධාන මාර්ගයේ සිට කි.මී. 03 ක පමණ දුරකින් පිහිටීම නිසා විදුලිය ලබාගැනීමේ දුෂ්කරතාවයකටද සභාව මුහුණ පා තිබුණි.

## 04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛනය අනුව වෙනත් ආදායම් හැර රු.16,380,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණ ද එයින් ලබාවී තිබුණේ සියයට 82 ලෙස රු.13,354,000 ක් සඳහා පමණි. එමෙන්ම ප්‍රාග්ධන ආදායම් යටතේ රු.61,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණද, ඉන් ලබාවී තිබුණේ සියයට 30 ක් ලෙස රු.18,349,000 ක් පමණි.

## 05. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). මූල්‍ය පාලනය

(ඇ). අයවැය පාලනය

(ඈ). ආදායම් පරිපාලනය

(ඉ). වත්කම් කළමනාකරණය

(ඊ). කොන්ත්‍රාත් පරිපාලනය